ඔස්ට්‍රේලියානු රජයේ Code of Behaviour සහ Bridging Visas

ඔබට ඔස්ට්‍රේලියාවේ රැඳී සිටීමට **Bridging Visa E** (බ්‍රිජිං වීසා ඊ බලපත්‍රයක්) ලැබී ඇත්නම් හෝ ඉදිරියේදී ලැබේ නම්, ඔස්ට්‍රේලියාවේ **Code of Behaviour** (චරයා ධර්ම පද්ධතිය) ඔබට වැදගත් වනු ඇත.

Code of Behaviour යනු ඔස්ට්‍රේලියාවේ නීති රීති අනුගමනය කරන බවට ඔබ දෙන පොරොන්දුවකි. මෙම දත්ත පත්‍රිකාව මගින් **Code of Behaviour** යටතේ ඔබට ඇති නීතිමය අයිතීන් සහ වගකීම් පිළිබඳව දැනුවත් කෙරේ.

Code of Behaviour
for Subclass 050 Bridging (General)
visa holders

Australian Government
Department of Immigration
and Border Protection

(Sinhalese)

Code of Behaviour - නෛතික තොරතුරු

Code of Behaviour යනු කුමක්ද?

Code of Behaviour යනු ඔබ ඔස්ට්‍රේලියාවේ නීති රීති අනුගමනය කරන බවට ඔබ දෙන පොරොන්දුවකි. එය ඔබ අත්සන් කළ යුතු පෝරමයකි. Bridging Visa E* ලබාගැනීමට හෝ නැවත අළුත් කර ගැනීමට නම් ඔබ Code of Behaviour අත්සන් කළ යුතුයි. Code of Behaviour මේ ආකාරයට දිස් වනු ඇත.


Australian Government
Department of Immigration and Border Protection

Code of Behaviour
for Subclass 050 Bridging (General) visa holders

Form 1443

ඔබට ඇති වීසා වර්ගය කුමක්දැයි ඔබ නොදන්නවා නම්, Departmentof Immigration and Border Protection වෙතින් හෝ ඔබේ විෂය හා සම්බන්ධව කටයුතු කරන නිලධාරියාගෙන් (case worker) අසා දැනගන්න.

ඔස්ට්‍රේලියාවේ නීති රීති පිළිබඳව මම නොදන්නවා නම්, කුමක් කළ යුතුද?

ඔස්ට්‍රේලියාව තුල බොහෝ නීති රීති ඇත. ඔස්ට්‍රේලියාව තුළ සිටින සියළුම පුද්ගලයින් මෙම නීති රීති අනුගමනය කළ යුතුයි. සෑම පුද්ගලයෙකුටම නීතිය යටතේ හිමිකම් ඇත.

ඔබ අනුගමනය කළ යුතු නීති පිළිබඳව දැනගැනීම ඔබේ වගකීමකි. මෙය සාධාරණ නොවන ලෙස පෙනුනත්, නීතිය පිළිබඳ මම නොදන්නවා යැයි පැවසීම නිදහසට කරුණක් නොවේ. ඔබට නොමිලේ නීති තොරතුරු සහ උපකාර අවශ්‍ය නම් මෙම තොරතුරු පත්‍රිකාවේ අග සඳහන්ව ඇති සේවාවන් තුලින් එවා ඔබට ලබාගත හැකිය.

මම නීති අනුගමනය නොකළ හොත් කුමක් සිදුවේද?

එනම්, ඔබ Code of Behaviour උල්ලංඝනය කර ඇති බැවින්, Department of Immigration විසින් ඔබේ වීසා පත් අවලංගු කිරීමට ඉඩ තිබේ.

ඔබ පහත සඳහන් වන නීති උල්ලංඝනය කළ හොත් ඔවුන් විසින් ඔබේ වීසා පත් අවලංගු කිරීමට ඉඩ තිබේ.

- ඔබ අනතුරුදායක ලෙස රිය පැදවුවහොත් හෝ ඔබේ රථය පැදවීමට සුදුසු මට්ටමේ නොමැති වීම
- ඔබ කිසිවකුට හෝ හිංසා කළ හොත් හෝ ඒ අයට සාහසික වීම.

තවද පහත සඳහන් කරුණු මතද Department of Immigration විසින් වීසා අවලංගු කිරීමට ඉඩ තිබේ.

- ප්‍රජාවට අනාරක්ෂිත බව දැනෙන ආකාරයේ කටයුතු සිදු කිරීම.
- දෙපාර්තමේන්තුව විසින් ඔබට පවසන දෑ සිදු නොකිරීම, උදාහරණයක් ලෙස, වැදගත් හමුවීමකට නොයාම.

මගේ වීසා බලපත්‍රය අවලංගු වුවහොත් කුමක් සිදුවේද?

වීසා පත් අවලංගු කිරීමට පෙර දෙපාර්තමේන්තුව විසින් ඔබට අනතුරු ඇඟවීමක් සිදු කිරීමට හෝ වීසා බලපත්‍රයේ සමහර කොන්දේසි වෙනස් කිරීමට ඉඩ තිබේ.

බ්‍රිජිං වීසා පත් අවලංගු කළ හොත් , ඔබට බොහෝ විට සංක්‍රමණ රැඳවුම වෙත යාමට සිදු වනු ඇත.

Code of Behaviour පිළිබඳව මට තව තොරතුරු සොයා ගත හැකිද?

ඔබ කළ යුතු දේ පිළිබඳව අපහැදිලි නම්, ඔබේ විෂය පිළිබඳ කටයුතු කරන නිලධාරියාගෙන් උපකාර ලබාගන්න. Code of Behaviour පිළිබඳ ඔබට ගැටලු ඇත්නම්, ඔබට වැඩිදුර තොරතුරු ලබාගත හැක්කේ කොතැනින්ද යන්න විෂය පිළිබඳ කටයුතු කරන නිලධාරියාගෙන් අහන්න නැතිනම් පහත සඳහන් සේවාවන් අමතන්න.

නීතිඥවරයෙකුට මට උදව් කළ හැකිද?

ඔබට පහත සඳහන් කරුණු සිදුවණා නම්, නොමිලේ උපකාර ලබාගත හැකිය.:

- ඔබ යම් කරදරයකට පත්ව සිටී නම් හෝ , ඔබ නීතිය හා සම්බන්ධ කරදරයකට පත්ව ඇතැයි සිතනවා නම්
- ඔබේ වීසා පත් ඉක්මනින් අවසන් වනවා නම් සහ ඔබ මීට පෙර කරදරයකට පත්ව තිබී නම්
- දෙපාර්තමේන්තුව විසින් ඔබේ වීසා පත් අවලංගු කරයි කියා ඔබ සිතන්නේ නම්
- වීසා අවලංගු කිරීමට අදහස් කරන බවට බවට ඔබ වෙත නිවේදනයක් ලැබී ඇත්නම්.

අපරාධ නීතිය සහ වෙනත් නීතිමය ගැටලු පිළිබඳව උපදෙස් ලබාදීමටත් ඔබට සංක්‍රමණ නීතිය පිළිබඳ උපදෙස් ලබාගත හැකි ස්ථාන පිළිබඳව පැහැදිලි කර දීමටත්, නීති සේවාවන්ට පුළුවන.

ප්‍රමාද නොවී හැකි ඉක්මනින් නීති උපදෙස් ලබාගැනීම වැදගත් වේ.

නොමිලේ නීති තොරතුරු සහ උපදෙස් සඳහා පහත සඳහන් ස්ථාන අමතන්න.

NT Legal Aid Commission 1800 019 343
www.ntlac.nt.gov.au

Cth Ombudsman 1300 362 072
www.ombudsman.gov.au

පරිවර්තකයන් සහ භාෂණ පරිවර්තකයන්

13 14 50 අංකය ඔස්සේ Translating and Interpreting Service (TIS) අමතා, ඔබ වෙනුවෙන් නීති සේවාවකට කථා කිරීම පිණිස භාෂණ පරිවර්තකයෙක් ලබා දෙන ලෙස ඉල්ලන්න. ඔබේ වීසා පත පිළිබඳව නීති සේවාවට පවසන්න. එවිට ඒ අයට නිවැරදි තොරතුරු ඔබට ලබාදීමට හැකිවනු ඇත. මෙය ඉතාම ඉදිසි බව ඒ අයට පවසන්න.